සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# නාට්‍ය හා රංග කලාව

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- පහත දැක්වෙන පද්‍ය කොටස් ඇසුරින් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A සුවඳ පද්ම ඕලු ආදී
නොයෙක පුෂ්පයෙන් සැදී
සරන හංස සේරු බෝම
පොකුණු සීත පැන් පිරී

B අපොයි කුකුල් හාමි අගෙයි
උදව් දෙන්න කැමති තමයි
දඟ නොකරන හොඳ ළමයින්
බලාගනියි හොඳ සතුටින්

C යාළු යාළු පුංචි යාළු
අමර අපේ පුංචි යාළු
හබුං කටයි බත් දෙකටයි
ඒ දෙකටෙන් අපිටත් දෙයි

D අහසින් අවුත් මිණි අක් නයිඳු යැදුමට
රහතන් මැදෙහි මුනි හිඳ මිණි පළඟ පිට
දහමුත් දෙසූ තැන කළ සැටරියන් කොට
මහ දාගැබ් සෙමින් වඳු සොළොස තැන්සිට

01 ඓතිහාසික කථාවක් හා සම්බන්ධ පද්‍ය වන්නේ,
(i) D (ii) B (iii) C (iv) A

02 ඉහත පද්‍ය අතරින් ''අමර ගියා දිව්‍ය ලෝකේ'' ළමා නාට්‍යයට අයත් පද්‍ය කුමක් ද?
(i) D (ii) B (iii) C (iv) A

03 ඉහත පද්‍ය අතුරින් ''පුංචි අපට දැන් තේරෙයි'' ළමා නාට්‍යයට අයත් පද්‍ය කුමක් ද?
(i) C (ii) D (iii) B (iv) A

04 සෝමලතා සුබසිංහ මහත්මිය විසින් රචනා කරන ලද නාට්‍යයකට අයත් ගීත කොටස වන්නේ,
(i) A (ii) B (iii) C (iv) D

05 නූර්ති ගීයක් අයත් පද්‍ය කුමක් ද?
(i) D (ii) A (iii) B (iv) C

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06 රූපවාහිනී මාධ්‍ය මගින් විකාශනය වන වේදිකා නාට්‍ය වැඩසටහනකි

(i) රංග භූමි (ii) අටපට්ටම (iii) දොරමඬලාව (iv) සූරියවිමන

07 අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යයේ සඳහන් නොවන චරිතයකි

(i) පූසා (ii) දොස්තර මාමා (iii) අම්මා (iv) මී හාමි

08 සිංහල ළමා චිත්‍රපටියක් වන්නේ,

(i) සිරි පැරකුම් (ii) සිඳූ

(iii) පුංචි අපට දූන් තේරෙයි (iv) මිණි පහන

09 කටහඬ අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා භාවිතා කරයි.

(i) පන්සිය පනස් ජාතක පොත (ii) නම් පොත

(iii) බයිබලය (iv) ගම්පෙරළිය

10 සොකරි, කෝලම්, නාඩගම් රඟදැක් වූ වේදිකා පිළිවෙලින් අයත් වරණය වන්නේ,

(i) කමත, තානායම්පොල, කරලිය (ii) තානායම්පොල, කරලිය, කමත

(iii) කරලිය, ප්‍රොසීනියම් වේදිකාව, සබය (iv) පූජා භූමිය, කරලිය, සබය

- **හිස්තැනට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

(පරිකල්පනය / තේමාව / සංවාද / ප්‍රබල / මිනිස් චර්යා)

11 රංගනයේදී චරිතයක් වේදිකාවට ගැලපෙන පරිදි සකස්කර ගැනීමට ............................................ අධ්‍යනය කළ යුතුය.

12 ........................................................................ නාට්‍යයේ සිදුවීම් ප්‍රේක්ෂකයාට දනවන ප්‍රධාන මෙවලමකි.

13 ............................................................................... යනු කතා වස්තුවෙන් ප්‍රකාශ කරන ප්‍රධාන අදහස වේ.

14 නාට්‍යයක වඩාත් ...................................................... හා අපූර්ව අවස්ථාව නාට්‍යෝචිත අවස්ථාවක් ලෙස හැඳින්විය හැක.

15 'වෙද පුටුව' ........................................................................ දියුණු කිරීම සඳහා කරනු ලබන රංග අභ්‍යාසයකි.

- **පහත දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16 සිද්ධි මනාව ගැලපීම කතාවක් සාර්ථක වීමට අත්‍යවශ්‍ය වේ. (    )

17 කඳුළු සැලීම ආංගික අභිනයට අයත් වේ. (    )

18 අනුකරණය සෑම මිනිසෙක් තුළම දක්නට ලැබෙන ලක්‍ෂණයකි. (    )


19 සමතලා භූමි ප්‍රදේශයකින් යුක්තවීම රංග භූමියක මූලික ලක්‍ෂණයකි. (    )

20 අපූර්වත්වයෙන් යුතු නිර්මාණ බිහිකිරීම සඳහා පරිකල්පනය අවශ්‍ය නොවේ. (    )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන තුනකි.)**

01



ඉහත පිංතූර වලින් දැක්වෙන ඒවා ඔබ පංති කාමරයේ දී ගුරුතුමා සමග නිර්මාණය කරන්නට ඇත.

(i) ඒවා අයත් වන්නේ කුමන අනුශාංගික කලාවකට ද? (ලකුණු 02)

(ii) ඒවා නිර්මාණය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය 5 ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙම අනුශාංගික කලා නිර්මාණයේ දි සැළකිලිමත් විය යුතු කරුණු 3 ක් දක්වන්න. (ලකුණු 03)

(iv) ඉහත රූප අතරින් ඔබ නිර්මාණය කළ එක් අංගයක් නිර්මාණය කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

02 (i) ඔබ දන්නා වේදිකා නාට්‍ය 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රව්‍ය මාධ්‍යයක්, දෘශ්‍ය මාධ්‍යයක්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ටෙලි නාට්‍යයක් හා වේදිකා නාට්‍යයක් අතර ඇති වෙනස්කම් 5 බැගින් වගුගත කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

03 (i) ක්ෂණික නිරූපණයක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ඔබට පංති කාමරයේදි ගුරුවරයා විසින් ලබාදුන් ක්ෂණික නිරූපණ මාතෘකා 3 ක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

04 (i) රංග අභ්‍යාස යනු කුමක් ද? (ලකුණු 02)

(ii) රංග අභ්‍යාස වලින් ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබ පංති කාමරයේදී ගුරුවරයා සමග ශරීරය උණුසුම් කිරීමේ රංග අභ්‍යාසයක් සිදුකළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

05 සෙල්ලම් කරමින් දබර නොවන්නේ
නොතරම් වදනින් බැණ නොම ගන්නේ
සෙල්ලම් කෙරුමෙන් වැඩ නොනසන්නේ
සෙල්ලම් විලසින් කල් නොයවන්නේ

මෙම කවිය ආශ්‍රය කරගනිමින් නාට්‍ය පිටපතක් රචනා කරන්න.

(මෙහිදී රංග විධාන, ගැටුම් අවස්ථා, නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.) (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) i (02) iii (03) iii (04) ii (05) ii (06) i (07) iv (08) i
(09) ii (10) i (11) මිනිස් චර්යා (12) සංවාද (13) තේමාව (14) ප්‍රබල
(15) පරිකල්පනය (16) ✓ (17) ✗ (18) ✓ (19) ✓ (20) ✗

## II කොටස

01 (i) වේෂ භූෂණ (ල. 02)

(ii) කාඩ්බෝඩ්, රෙදි, කතුරු, බයින්ඩර් ගම්, බොත්තම්, වැලි, ලී කුඩු, ඇට වර්ග, ඩස්ට් වර්ග, කෝඩ් නූල් ආදී ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)

(iii)
* නාට්‍ය පෙළෙහි දැක්වෙන චරිතයට උචිත වීම.
* කාලයට, දේශයට, යුගයට ගැලපීම.
* චරිතය හඳුනාගැනීමට හැකිවීම.
* රංගන කාර්යයට බාධා නොවීම.
* සාමාන්‍ය ජීවිතයේ පළඳින ආභරණවලට වඩා විශාලවීම යනාදී ගැලපෙන පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iv) පංති කාමරයේදී නිර්මාණය කළ ආකාරය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

02 (i) වේදිකා නාට්‍ය 2 ක් නම් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 02)

(ii) ශ්‍රව්‍ය මාධ්‍ය - ගුවන්විදුලිය - දෘශ්‍ය මාධ්‍ය - පුවත්පත් සඟරා, නව කතා, කෙටිකතා, චිත්‍ර, මූර්ති, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය - රූපවාහිනිය, චිත්‍රපට (ල. 03)

(iii)

| <u>ටෙලි නාට්‍ය</u> | <u>වේදිකා නාට්‍ය</u> |
|---|---|
| * ශ්‍රව්‍ය, දෘශ්‍ය වේ. | ශ්‍රව්‍ය, දෘශ්‍ය, සජීවී වේ. |
| * ඕනෑම කෙනෙකුට එකම වේලාවේ නැරඹිය හැක. | එක් අවස්ථාවක නැරඹිය හැක්කේ සීමිත පිරිසකට පමණි. |
| * කාලය පිළිබඳ සීමාවක් නැත. | කාලය පිළිබඳ සීමාවක් ඇත. |
| * අවකාශය පිළිබඳ සීමාවක් නැත. | අවකාශය පිළිබඳ සීමාවක් ඇත. |
| * ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ අවස්ථාවේම ලැබිය නොහැක. | ප්‍රේක්ෂක ප්‍රතිචාර එවෙලේම ලැබිය හැක. නාට්‍ය වේදිකාගතවන සෑම අවස්ථාවකම ප්‍රතිලාභ ලබයි. |

ආදී ලෙස ප්‍රශ්නයට අදාළ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

03 (i) දෙන ලද මාතෘකාවකට අනුව පෙර සූදානමකින් තොරව, පිටපතක් නොමැතිව, කෙටි කාලයක් තුළ චරිතයක්, සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වීම. (ල. 02)

(ii) ගැළපෙන මාතෘකා ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) ක්ෂණික තීරණ ගැනීම, පරිකල්පන ශක්තිය. නිර්මාණශීලී චින්තනය, සබකෝලයෙන් තොරව ඉදිරිපත් කිරීමේ හැකියාව, සාමූහිකත්වය වර්ධනය වීම ආදී කරුණු පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

04 (i) නළුවාගේ ශාරීරික හා මානසික සමබරතාවය ඇතිකර ගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස (ල. 02)

(ii)
1. ක්‍රියාශීලී වීම.
2. අනුකරණ හැකියාව වර්ධනය වීම.
3. මානසික ඒකාග්‍රතාවය ඇතිවීම.
4. රූපණ හැකියාව වර්ධනය වීම ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) පංති කාමරය තුළ රංග අභ්‍යාස සිදුකළ ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

05 ගැටුම් අවස්ථා, නාට්‍යෝචිත සිදුවීම්, රංග විධාන ආදිය පිළිබඳ සළකා ලකුණු ලබාදෙන්න. (ල. 10)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**දෙවන වාර පරීක්ෂණය 2019**

**7 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **ප්‍රායෝගික පරීක්ෂණය**

01 නාට්‍ය ගීතයක් ගායනා කරමින් රංගනයේ යෙදෙන්න. (ලකුණු 10)

02 පහත සඳහන් භාණ්ඩ වෙනත් භාණ්ඩයක් ලෙස යොදාගනිමින් රංගනයක් ඉදිරිපත් කරන්න.

* බටනලාව * පැන්සල් පෙට්ටිය * අඩිරූල
* බිස්කට් පෙට්ටිය * කුඩය (ලකුණු 10)

03 පහත දී ඇති වචන අර්ථ තුනක් මතුවන සේ උච්චාරණය කරන්න.

* කවුද * මැරියා * ඇයි
* බයයි * යන්ඩ එපා (ලකුණු 10)

04 සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත මාතෘකා අතුරින් එකක් ලබාදී කණ්ඩායම් නාට්‍ය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන්න.

* සක්‍ර භවනට යම රජුගේ පැමිණීම.
* සිල් සමාදන් වූ ස්ථානයට නාඳුනන පුද්ගලයකු පැමිණීම.
* කැළෑ සතුන් අතරට ආ අමුතු ජීවියෙක්
* ආදිවාසීන්ගේ මංගල උත්සවයදා (ලකුණු 10)